කාර්යාල චක්‍රලේඛ අංක : එස්-1/2AT (2017)
මගේ අංකය : එස්-1/2 ඒටී (2017)
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
306/72, පොල්දුව පාර,
බත්තරමුල්ල.

2016 දෙසැම්බර් 02 දින

අදාල සියළුම නිලධාරීන් වෙත

**<u>2017 වාර්ෂික ස්ථාන මාරුවීම් හා අනුයුක්ත කිරීම්</u>**

**<u>ශ්‍රී ලංකා විගණන සේවය</u>**

අංක එස්-1/2 AT (2017) සහ 2016 නොවැම්බර් 15 දිනැති කාර්යාල චක්‍රලේඛය හා බැඳේ. එම චක්‍රලේඛය මගින් නිකුත් කළ වාර්ෂික ස්ථාන මාරු කිරීම්/ අනුයුක්ත කිරීම් වලට අදාලව ඉදිරිපත් වූ අභියාචනා සහ සේවා අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන නැවත සකස් කරන ලද ඇමුණුම I හි සඳහන් 2017 වාර්ෂික ස්ථාන මාරු කිරීම්/අනුයුක්ත කිරීම් 2017 ජනවාරි 02 දින සිට ක්‍රියාත්මක කිරීම මෙයින් නියෝග කරමි.

02. ස්ථාන මාරු කිරීම් / අනුයුක්ත කිරීම් වලට යටත් සියළුම නිලධාරීන් නව සේවා ස්ථාන වල රාජකාරි භාර ගැනීමට පෙර තමන් භාරයේ ඇති ලිපි ලේඛන සම්බන්ධයෙන් තම අංශ ප්‍රධානීන්ගේ උපදෙස් පරිදි ක්‍රියා කළයුතු අතර, ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සම්බන්ධයෙන් 1985 මාර්තු 22 දිනැති අංක ඊආර්/ඩීසී/83 දරණ කාර්යාල චක්‍රලේඛයේ උපදෙස් පරිදි ක්‍රියා කල යුතුය. එසේ නොකරන නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය පරිදි විනයානුකූලව කටයුතු කිරීමට සිදුවිය හැකිය.

03. ස්ථාන මාරු කිරීම් /අනුයුක්ත කිරීම් වලට යටත් වන සියළුම නිලධාරීන් නියමිත දින නව ශාඛාවේ රාජකාරි භාරගෙන තම අංශ ප්‍රධානී මගින් එස් - 1 ශාඛාවට වහාම දන්වා එවිය යුතු අතර, ඔබගේ පෞද්ගලික ලිපිගොනුවට අදාල ඉදිරි කටයුතු සිදුකරනු ලබන්නේ එම ලිපිය එස් - 1 ශාඛාවට ලැබීමෙන් පසුව පමණක් බවද අවධාරණය කරමි.

04. මෙම ස්ථාන මාරු කිරීම් /අනුයුක්ත කිරීම් සම්බන්ධයෙන් උපවේශන දීමනා ගෙවනු නොලැබේ.

එම්.එස්.කපුකොටුව
අධ්‍යක්ෂ (පාලන)
විගණකාධිපති වෙනුවට

එම්. එස්. කපුකොටුව
ශ්‍රී.ලං.ප.සේ. I
අධ්‍යක්ෂ (පාලන)
විගණකාධිපති දෙපාර්තමේන්තුව
බත්තරමුල්ල.

පිටපත්:-
01. ප්‍රධාන ගණකාධිකාරී - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.
02. සියළුම අංශ ප්‍රධානීන් - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.
03. පෞ.ලිපිගොනුව